**2024-02-12 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

## 01. වාණිජ වැවිලි කළමනාකරණය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වැනි රජයේ වැවිලි ආයතන සතු විශාල ඉඩම් ප්‍රමාණයක් නීතිමය ගැටලු, ආයතනික ගැටුම්, ප්‍රාග්ධන හිඟය යනාදී විවිධ හේතූන් මත දීර්ඝ කාලයක් තිස්සේ වගාවකින් හෝ ඵලදායි භාවිතයකින් තොරව පවතින බව 2023 සහ 2024 වර්ෂයන් සඳහා වූ අයවැය කථාවන්හිදී ගරු ජනාධිපතිතුමා විසින් පෙන්වා දී ඇත. එවැනි විශාල පරිමාණයේ ඉඩම් හා ඌණ උපයෝජිත ඉඩම් අපනයනය කළ හැකි භෝග වගා කිරීම, අපනයනය සඳහා පශු සම්පත් ගොවිපොළ ඇති කිරීම සහ වෙනත් අපනයනය කළ හැකි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා විභවතාවයන් සහිත තෝරා ගනු ලබන ආයෝජකයන් වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීම යෝග්‍ය බවට හඳුනා ගනු ලැබ ඇත. ඒ සඳහා දේශීය ව්‍යවසායකයන් සම්බන්ධ කර ගනිමින් සමාජයට බහුවිධ ප්‍රතිලාභ අත්වන අයුරින් එකී ඉඩම් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම පිණිස රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය විසින් වැවිලි ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලක් සකස් කරනු ලැබ ඇත. එකී වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

## 02. ගම්පහ බියගම ප්‍රදේශයේ ජාතික රෝහලක් සහ ළමා රෝහලක් ස්ථාපිත කිරීම

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිදු වන අධික ජනගහන වර්ධනය සහ කාර්මීකරණයට සමගාමීව එම දිස්ත්‍රික්කය ප්‍රධාන සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරනු ලබයි. ඒ හේතුවෙන් සෞඛ්‍ය සේවා සඳහා වන ඉල්ලුම ඉහළ යමින් පවතින අතර එකී ඉල්ලුම සපුරාලීම සඳහා ජාතික රෝහලක් සහ ළමා රෝහලක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ ජාතික රෝහලක් සහ ළමා රෝහලක් එම දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා බියගම උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අක්කර 7යි රූඩ් 3ක් වන ඉඩම් කොටස් දෙකක් අත්කර ගෙන මූලික යටිතල පහසුකම් සැලසීමෙන් අනතුරුව යෝජිත

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. කෘත්‍රිම බුද්ධිය පිළිබඳ පාඨමාලා අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම

කෘත්‍රිම බුද්ධිය පිළිබඳ පාඨමාලා අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම සම්බන්ධයෙන් 2023-10-02 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගත් අවස්ථාවේදී කෘත්‍රිම බුද්ධියට අදාළව ජාතික උපායමාර්ගයක් සහ සැලැස්මක් සකස් කිරීම පිණිස පත් කරනු ලැබ ඇති කාර්යසාධක බලකාය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන්ට අනුගතව යෝජිත පාඨමාලා හඳුන්වා දීම සුදුසු බවට තීරණය කරන ලදී. ඒ අනුව, අදාළ උපායමාර්ග සැලැස්මේ එක් අංගයක් වශයෙන් සාමාන්‍ය අධ්‍යාපනයට අදාළව කෘත්‍රිම බුද්ධිය පිළිබඳ පාඨමාලා හඳුන්වා දීම පිණිස නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එකී නියමු ව්‍යාපෘතිය මයික්‍රොසොෆ්ට් ආයතනයේ ද සහාය ඇතිව පහත සඳහන් අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* දැනට මයික්‍රොසොෆ්ට් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාත්‍යන්තර විෂය නිර්දේශයන් ජාතික අධ්‍යාපන ආයතනයේ නිර්දේශ මත සංශෝධනය කර අවශ්‍ය මූලික මානව සම්පත් පවතින පාසල්වල 8 වන ශ්‍රේණියේ සිට යෝජිත නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.

* මයික්‍රොසොෆ්ට් ආයතනය විසින් සපයනු ලබන පහසුකම් යටතේ නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගනු ලබන පාසල් ඩිජිටල්කරණය කිරීම.

* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය උගන්වනු ලබන ගුරුවරුන් 100ක් මයික්‍රොසොෆ්ට් ආයතනය මගින් පුහුණුකරුවන් වශයෙන් පුහුණු කිරීම.

04. **අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය සඳහා වන සංශෝධනයට අදාළ සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම**

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය (චිකාගෝ සම්මුතිය) සඳහා ශ්‍රී ලංකාව 1948 දී අත්සන් තබා ඇති අතර, ඒ අනුව එම සමුම්තිය සඳහා වන පාර්ශ්වීය රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත් වී ඇත. පියාසර කරමින් තිබෙන සිවිල් ගුවන්යානාවකට එරෙහිව පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් අවි භාවිත කිරීම වැළැක්වීමට හැකි වන පරිදි චිකාගෝ සම්මුතිය සංශෝධනය කිරීම පිණිස 1984-05-10 දින පැවති අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ 25 වන මහා මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති අතර, එකී සංශෝධනය 1998-10-01 වන දින සිට බලාත්මක වේ. චිකාගෝ සම්මුතිය සඳහා වන එකී සංශෝධනයට අදාළ සන්ධාන පත්‍රය (3 වැනි ව්‍යවස්ථා අතිරේකයට - Article 3 bis) වෙත ශ්‍රී ලංකාව ප්‍රවේශ වීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම පිණිස කමිටුවක් පත් කරනු ලැබ ඇති අතර, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ උපලේඛනය තුළ අදාළ 3 වැනි ව්‍යවස්ථා අතිරේකය ඇතුළත්ව පවතින බැවින් එකී සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීමට බාධාවක් නොමැති බව කමිටුව විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව, 1984-05-10 වැනි දින මොන්ට්‍රියල්හිදී අත්සන් කළ අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය සඳහා වන සංශෝධනයට අදාළ සන්ධාන පත්‍රය (ව්‍යවස්ථාව 3 අතිරේකය) වෙත ප්‍රවේශ වීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **මඩු පාර ජාතික උද්‍යානය තුළ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රක්ෂිතභාවයෙන් බැහැර කරන ලද භූමි ප්‍රමාණය වනජීවී රක්ෂිත ප්‍රදේශයක් ලෙස පැවතීම අවසන් කිරීම**

මඩු පාර අභය භූමියේ නීතිමය තත්ත්වය ඉහළ නැංවීම සඳහා එකී අභය භූමිය ජාතික උද්‍යානයක් ලෙස උසස් කිරීමට උතුරු සළාතේ ක්‍රමෝපායික පාරිසරික ඇගයීම් මඟින් සිදු කරන ලද යෝජනාවක් අනුව, එම අභය භූමිය තුළ පැවති ඇතැම් ජනාවාස රක්ෂිතභාවයෙන් ඉවත් කරමින් සහ ඊට යාබදව පැවති වනාන්තර කොටස් ඇතුළත් කරමින් මඩු පාර අභය භූමිය ජාතික උද්‍යානයක් වශයෙන් 2015-06-22 දින ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර ඇත. මඩු පාර රක්ෂිතය තුළ තවදුරටත් පැවති දීර්ඝ කාලයක පටන් වගා කරනු ලබන කුඹුරු ඉඩම් සහ ජනාවාස ලෙස සංවර්ධිත භූමි ප්‍රමාණය රක්ෂිතභාවයෙන් නිදහස් කළ යුතු බවට තීරණය කර ඇති අතර, ඒ අනුව, හෙක්ටයාර් 56.8ක භූමි ප්‍රමාණයක් 2023-08-08 දිනැති ගැසට් නිවේදනය මඟින් රක්ෂිතභාවයෙන්

නිදහස් කිරීමට පියවර ගෙන තිබේ. රක්ෂිතභාවයෙන් මුදා හරින ලද එකී භූමි ප්‍රමාණය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින් නිදහස් කිරීම පිණිස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **රුසියාවේ ප්‍රවාහන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය අතර සහයෝගිතාව වර්ධනය කිරීම හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ පිරිස් නැවත පුහුණු කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම**

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින් මෑතකදී රුසියාවේ සිදු කරන ලද නිල සංචාරය අතරතුර පැවති සාකච්ඡාවලදී දෙපාර්ශ්වය අතර සහයෝගිතාව වර්ධනය කර ගැනීම පිණිස රුසියාවේ ප්‍රවාහන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරනු ලැබ ඇත. ඒ අනුව, සකස් කරනු ලැබ ඇති කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාශනය ලබා ගැනීමට යටත්ව, දෙපාර්ශ්වය අතර එකී ගිවිසුමට අත්සන් තැබීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **2024 ජාත්‍යන්තර ශ්‍රීමත් භගවත් ගීතා මහෝත්සවය ශ්‍රී ලංකාවේ පැවැත්වීම**

හින්දු භක්තිකයින්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය ලෙස සැලකෙන ශ්‍රීමත් භගවත් ගීතාව සම්බන්ධ ආගමික සිදුවීම් මාලාව හා ශ්‍රීමත් භගවත් ගීතාව වෙනුවෙන් වන්දනීය උපහාරයන් පිදීම සඳහා ඉන්දියාවේ හර්යානා ප්‍රාන්තයේ කුරුක්ෂේත්‍ර සංවර්ධන මණ්ඩලය විසින් වාර්ෂිකව භගවත් ගීතා මහෝත්ස්වය පවත්වනු ලබයි. මෑත වර්ෂවලදී එම උත්සවය විදේශයන්හිදී ද පවත්වා ඇති අතර, 2024 වර්ෂයේ ජාත්‍යන්තර ශ්‍රීමත් භගවත් ගීතා මහෝත්සවය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජනා කර ඇත. ඒ අනුව, ඉන්දියාවේ හර්යානා ප්‍රාන්තයේ කුරුක්ෂේත්‍ර සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රහය මත එම උත්සවය 2024-03-01 දින සිට 2024-03-03 දින දක්වා නෙළුම් පොකුණ පරිශ්‍රයේදී පැවැත්වීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් සඳහා වන නිවාස වැඩසටහන**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ බලපත්‍රලාභී බැංකු සමඟ සහයෝගයෙන් විගමණික ශ්‍රමිකයන් සඳහා නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එම වැඩසටහන යටතේ උපරිම වශයෙන් රුපියල් මිලියන 10ක ණය පහසුකමක් ලබා දීමටත්, ඒ සඳහා වන පොලී පිරිවැයෙන් කොටසක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් දැරීමටත් අපේක්ෂා කෙරේ. යෝජිත ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගනු ලබන ණය මුදල, ණයලාභියා විසින් විදේශ රැකියාවක නිරත වී සිටින කාලය තුළ නිත්‍යානුකූල මාර්ගවලින් ප්‍රේෂණය කරනු ලබන විදේශ මුදලින් ගෙවිය යුතු අතර විදේශ රැකියාව නිම කර මෙරටට පැමිණි පසු ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, යෝජිත නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **'සමුපකාර චතුරස්‍රය' නමින් සමුපකාර වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීම**

'සමුපකාර චතුරස්‍රය' නමින් සමුපකාර වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව 2023-11-27 දින පැවති රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලදුව, යෝජිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම පිණිස ජාතික සංවර්ධන කමිටුව වෙත යොමු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, ජාතික සංවර්ධන කමිටුව විසින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිර්දේශ කරනු ලැබ තිබේ. එකී නිර්දේශය මත පදනම්ව, ඒකාබද්ධ අරමුදලට වැය බරක් නොවන පරිදි අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවා සුදුසු ආයෝජකයෙකු හඳුනාගෙන, රාජ්‍ය-පෞද්ගලික හා සමුපකාර හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් වශයෙන් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. ඉඩම් අවසරපත්‍ර හා දීමනාපත්‍රලාභීන්ට රජයේ ඉඩම්වල පරම අයිතිය ලබා දෙන "උරුමය වැඩසටහන" ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහජනතාව වෙත ලබා දී ඇති ඉඩම් සඳහා අදාළ කර ගැනීම

ඉඩම් අවසරපත්‍ර හා දීමනාපත්‍රලාභීන්ට රජයේ ඉඩම්වල පරම අයිතිය ලබා දෙන "උරුමය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් 2023-12-11 දින පැවති රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනට අනුගතව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහජනතාව වෙත ලබා දී ඇති ඉඩම්වලට අදාළව ද "උරුමය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම පිණිස වාරිමාර්ග අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 11. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, මේ වන විට එම පනතේ විධිවිධාන ක්‍රියාත්මකව පවතී. එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද සංශෝධනයන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුගතව සිදු කළ යුතුව තිබූ බැවින්, ක්ෂේත්‍රයේ විශේෂඥයින් විසින් ඉදිරිපත් කර තිබූ සංශෝධන යෝජනා එකී පනත් කෙටුම්පතට හඳුන්වා දීමට හැකි වී නොමැත. එබැවින්, අදාළ සංශෝධන යෝජනා ඉදිරිපත් කර තිබූ ක්ෂේත්‍රයේ විශේෂඥයින් සමඟ තවදුරටත් සාකච්ඡා කර හඳුනාගනු ලැබ ඇති සංශෝධන මත පදනම්ව මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********